# 2023 පෙබරවාරි මාසයට අදාලව 2023.02.07 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2023.02.07
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය** -

| | |
|---|---|
| 01. ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා | - ගරු සභාපති |
| 02. එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. එම්.ඒ. උබේසේන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. බී. විල්මට් සිල්වා මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 08. බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 11. ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 12. ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 13. ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 14. එච්.එම්. සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 15. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |

**පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හෙබ වීය.2023.01.05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2023.01.31 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

එහිදි ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් 2023.01.05 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

## 02. මූලාසනය විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

කිසිවක් ඉදිරිපත් වී නැත.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබිම.

**ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා**

බිබිල,අඹේලන්ද ලිපිනයේ පදිංචි ඒ.පී.රෝහිත මහතා විසින් ප්‍රාදේශීය සභාවෙන් ලබා දුන් ජංගම වෙළඳකුටියක් මොණරාගල පාර 01 කණුව පාර අසල වෙළඳාම් කිරීම සඳහා ලබා ගත් අතර සැලසුම් කරන ලද ආකාරයෙන් ආදායමක් නොලද බැවින් ප්‍රාදේශීය සභාවට අයවිය යුතු

මාසික කුලී මුදල නිසි පරිදි ගෙවීමට නොහැකි නිසා ඉදිරියේදී මාසික කුලිය රු.500.00ක් ලෙස ත් හිඟ මුදල කපා හැරින ලෙසත් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපි ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නැත.

## 05.යථාපරිදි කල්දී ඇති යෝජනා.

## 05.01.ගරු මූලාසනයේ යෝජනා.

### 05.01.01. අවුරුදු මේලා ප්‍රචාරක වැඩසටහන සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සම්බන්ධවයි.

බිබිල,ඉසුරු සවුන්ඩ් මහියංගන පාර ලිපිනයේ ඇති ඉසුරු සවුන්ඩ් අන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් විසින් 2023.04.08 දින සිට 2023.04.12 දින දක්වා වෙළඳ ප්‍රචාරක වැ සටහන සඳහා පෙ.ව.8.00 සිට ප.ව.8.00දක්වා ශබ්ද විකාශන යන්ත්‍ර ස්ථානගත කර ප්‍රචාරක කටයුතු කරගෙන යෑම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී ගැසට් පත්‍රයේ දිනකට අයකල යුතු මුදල ලෙස රු.8000.00 ක් සඳහන් වන බැවින් දිනකට රු.8000.00 බැගින් අය කිරිම සුදුසු බවටත් ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසිවලට යටත්ව අධිකරණ කටයුතු වලට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා පාසල් වේලාවන්වලදී ඔවුනට කරදරයක් නොවන ආකාරයෙන් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරිම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගැසට් පත්‍රයේ දිනකට අයකල යුතු මුදල ලෙස රු.8000.00 ක් සඳහන් වන බැවින් දිනකට රු.8000.00 බැගින් අය කිරිම සුදුසු බවටත් ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසිවලට යටත්ව අධිකරණ කටයුතු වලට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා පාසල් වේලාවන්වලදී ඔවුනට කරදරයක් නොවන ආකාරයෙන් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරිම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 05.01.02.බිබිල ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් දේපල දෙවන වරටද ප්‍රසම්පාදනය කළ ද ප්‍රසම්පාදනය නොවූ බව දැනුම් දීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් කරවල වෙළඳසැල,අංක 02 කුකුළු මස් වෙළඳසැල හා අංක 03 කුකුළු මස් වෙළඳසැල පහත මිල ගණන් යටතේ ප්‍රසම්පාදනය කිරීම සඳහා දෙවන වරටද

ප්‍රසම්පාදන දැන්වීම ප්‍රදර්ශනය කළත් එම කඩකාමර මේ වන තෙක් කිසිවෙක් ඉල්ලීම් කර නොමැත. මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දේපල | 2022 අවම ලංසුව | 5%ක් අඩු වූ පසු නැවත ටෙන්ඩර් කරන මුදල | ටෙන්ඩර් පෝරම ගාස්තු (ආපසු නොගෙවන) | ටෙන්ඩර් ඇප තැන්පත් (ආපසු ගෙවන) |
|---|---|---|---|---|---|
| 01 | කරවල වෙළඳසැල | 64,367.10 | 61,148.74 | 2,000.00 | 1,250.00 |
| 02 | අංක 02 කුකුළු මස් වෙළඳසැල | 520,200.00 | 494,190.00 | 2,000.00 | 9,800.00 |
| 03 | අංක 03 කුකුළු මස් වෙළඳසැල | 450,840.00 | 428,298.00 | 2,000.00 | 8,500.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී "කුකුළු මස් වෙළඳසැල" යන නම වෙනස් නොකිරීම සුදුසු බවත් බල ප්‍රදේශයෙන් පිටත බලපත්‍රයක් නොමැතිව පවත්වාගෙන යනු ලබන අනවසර කුකුල් මස් වෙළඳසැල් සඳහා අතුරු ව්‍යවස්ථාවට අනුව නඩු පැවරීම සුදුසු බවත් එවිට මෙම අංක 02 හා 03 කුකුල් මස් වෙළඳසැල් සඳහා ඉල්ලුමක් ගොඩනැගෙන බවත් ඒ තුලින් මහජනතාවගේ සෞඛ්‍යාරක්ෂාවට විසඳුමක් ඇති වන බවත් මේ සඳහා නීතිඥ සහය ලබා ගැනීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

"කුකුළු මස් වෙළඳසැල" යන නම වෙනස් නොකිරීම සුදුසු බවත් බල ප්‍රදේශයෙන් පිටත බලපත්‍රයක් නොමැතිව පවත්වාගෙන යනු ලබන අනවසර කුකුල් මස් වෙළඳසැල් සඳහා අතුරු ව්‍යවස්ථාවට අනුව නඩු පැවරීම සුදුසු බවත් එවිට මෙම අංක 02 හා 03 කුකුල් මස් වෙළඳසැල් සඳහා ඉල්ලුමක් ගොඩනැගෙන බවත් ඒ තුලින් මහජනතාවගේ සෞඛ්‍යාරක්ෂාවට විසඳුමක් ඇති වන බවත් මේ සඳහා නීතිඥ සහය ලබා ගැනීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.03. CCTV කැමරා පද්ධතියක් හා ඇඟිලි සලකුනු යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ අළුතින් ඉදිකරනු ලබන වාහන සේවා මධ්‍යස්ථානයේ හා රථ ගාල සඳහා නව CCTV කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීමත් පුවක්පැලේ කසල අංගනයේ සේවකයින් සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකිරීම සුදුසු බවත් ඒ සඳහා මිල ගණන් කැඳවීමත් සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී ආදාහනාගාරයට,පුවක්පැලේ කසල අංගනයට හා පෙර පාසලට ද CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීම සුදුසු බවත් පුවක් පැලේ කසල අංගන සේවකයින්ට හා බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්යාලයට හා කොටගම මහජන පුස්තකාලයට ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය බවත් ඒ සඳහා සුදුසු උපකරණ ලබා ගැනිමට මිල ගණන් කැඳවීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ජී. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ආදාහනාගාරයට,පුවක්පැලේ කසල අංගනයට හා පෙර පාසලට ද CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීම සුදුසු බවත් පුවක් පැලේ කසල අංගන සේවකයින්ට හා බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්යාලයට හා කොටගම මහජන පුස්තකාලයට ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කිරීම සුදුසු බවටත් ඒ සඳහා මිල ගණන් කැඳවීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.04. වැඩ පරිපාලක තනතුරට හිමි දීමනා ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ වැඩ පරිපාලක බී.එම්.මහේෂ් මධුෂාන් ජයසේකර විසින් ඔහුට පැවරී ඇති රාජකාරි ඉටු කර ගෙන යාමේ දී බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දිනකට කිලෝමීටර් 50ක පමණ සීමාවක් ආවරණය කිරීමට සිදු වන බවත් ඒ සඳහා ඔහුගේ පෞද්ගලික යතුරු පැදිය භාවිතා කරන බැවින් තම තනතුරට හිමි ගමන් වියදම ලෙස රු.10,000.00කට ආසන්න මුදලක් ලබා ගැනිමට හැකියාවක් ඇති බැවින් එම මුදල ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී රු.7500.00ක උපරිමයකට යටත්ව දීමනාව ලබා දීම සුදුසු බවත් එහිදී තමා විසින් මසකට කරනු ලබන සේවාවේ ලැයිස්තුවක් සකස් කර තාක්ෂණික නිළධාරීගේ හා ලේකම්තුමියගේ නිර්දේශය හා අනුමැතිය ඇතිව කිරීම සුදුසු බවත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් පසුව මෙම දීමනාව ගෙවීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ජී. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

රු.7500.00ක උපරිමයකට යටත්ව දීමනාව ලබා දීම සුදුසු බවත් එහිදී තමා විසින් මසකට කරනු ලබන සේවාවේ ලැයිස්තුවක් සකස් කර තාක්ෂණික නිළධාරීගේ හා ලේකම්තුමියගේ

නිර්දේශය හා අනුමැතිය ඇතිව කිරිම සුදුසු බවත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් පසුව මෙම දීමනාව ගෙවීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**මාසික සභා රැස්වීම තේ පැන් සංග්‍රහය සඳහා පෙ.ව 11.30ට අවසන් කර අතර නැවත පෙ.ව.11.45ට ආරම්භ කරන ලදී.**

## 05.01.05.කසල කළමනාකරණ මධ්‍යස්ථානය හා විදුලි වැට ඉදි කිරිම -2021 බිබිල ප්‍රාදේශීය සභාව.

පළාත් මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරිම හා ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පුවක් පැලේ කසල කළමනාකරණ මධ්‍යස්ථානය ඉදි කිරිමට අදාළ ව අනුමත මුදල් ප්‍රතිපාදන සීමාව තුල ඉංජිනේරු මහතාගේ නිර්දේශය සහිත ව පළාත් පාලන කොමසාරිස් විසින් සංශෝධිත ඇස්තමේන්තු ප්‍රකාරව අනුමත කළ අවසන් බිල්පතෙහි වටිනාකම රුපියල් 5,879,459.29 කි. එහෙත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) විසින් පළාත් පාලන කොමසාරිස්ගේ 2022.01.06 දිනැති ලිපියට අනුව බිල්පත් පියවීමේ දී අවසාන බිල්පතේ අගයට වඩා අඩු මුදලක් ලබා දී ඇත. එම මුදල රුපියල් 5,770,117.64 ක මුදලකි.එල්.ඩී.කන්ස්ට්‍රක්ෂන් ආයතනයට තවත් ගෙවිය යුතු හිඟ මුදල රු.109,341.65කි. මේ පිළිබඳ පළාත් පාලන කොමසාරිස්ට පිටපත් සහිතව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) දැනුවත් කර ඇතත්, ඒ පිළිබඳ සාධනීය පිළිතුරක් නොලැබුනු බැවින් එම රුපියල් 109,341.65ක හිඟ මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී මෙම යෝජනාවට විපක්ෂ මන්ත්‍රීවරුන් වන එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා, එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය හා ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය යන අය විරුද්ධ වන බව ප්‍රකාශ කල අතර එහිදී සභා අරමුදලින් නොගෙවා පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ම එය ගෙවීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී සභා අරමුදලින් නොගෙවා පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ම එය ගෙවීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ බහුතර මතය හිමිවූයෙන් තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**05.01.06. වැඩ පරිපාලක මහතාට 2023 වර්ෂය සඳහා හිමි සපත්තු කට්ටලය ලබා ගැනීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවේ වැඩ පරිපාලක තනතුරෙහි සේවය කරන B.M.M.M. ජයසේකර මහතා 2023 වර්ෂයට හිමි සපත්තු කට්ටලය ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. පාලන අංක 161 චක්‍ර ලේඛය ප්‍රකාරව වැඩ පරිපාලකවරුන්ට සපත්තු කුට්ටමක් හා කොට මේස් කුට්ටමක් ලබා ගැනීමට හැකියාව තිබේ.නමුත් මෙහි දී ලබා ගත යුතු මූල්‍යාම සීමාව දක්වා නොමැති බැවින් වැඩ පරිපාලකට හිමි සපත්තු කුට්ටම ලබා දීම සුදුසු බවත් ඒ සඳහා වැය වන මූල්‍ය සීමාව පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී රු.7000.00ක මුදලක් ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

රු.7000.00ක මුදලක් ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.07.බිබිල ප්‍රාදේශීය සභා බිබිල පෙර පාසලේ පවතින ගැටළු දැනුම් දිම සම්බන්ධවයි.**

පෙර පාසලට බාහිරෙන් ඇතුල්වන පුද්ගලයින් විසින් පෙර පාසලේ ඇතුලතින් ඇති වැසිකිලි 2 හි කොන්ඩිපට්ටම් කඩා ඇති අතර එම ස්ථානයට බාහිර පුද්ගලයින්ට ඇතුල්විය නොහැකි වන පරිදි **ගොඩනැඟිල්ලේ විවෘත කොටස සඳහා ආරක්ෂිත දොරවල් දෙකක් දැල්වලින් ආවරණය වන පරිදි සකස් කිරිම** මඟින් ගොඩනැගිල්ල ආරක්ෂිත වන බව බැවින් එසේ සකස් කිරීම සුදුසු බවත්, **පෙර පාසලට ඇතුලුවන ප්‍රධාන ගේට්ටුව පස් වලින් වැසි ඇති බැවින්** ප්‍රධාන ගෙට්ටුව ඉබි යතුරු දමා ලොක් කිරීමට නොහැකි බැවින් එම **පස් ඉවත් කිරීම** සුදුසු බවත්,පෙර පාසල් ඉඩමේ ප්‍රධාන මාර්ගය දෙසට ඇති කොටස සම්පූර්ණයෙන්ම විවෘතව පවතින අතර නගරයේ ගැවසෙන පුද්ගලයින්ට කිසිදු බාධාවකින් තොරව **පෙර පාසල් භූමියට** ඇතුල්වීමේ හැකියාව ඇති අතර එය පෙර පාසලේ දරුවන්ගේ සහ පෙර පාසලේ ආරක්ෂාව සඳහා අහිතකර වන අතර, ඒ සඳහා වැට **සකස් කිරීම** සුදුසු බවත්, පෙර පාසලේ පිටත ඇති **වැසිකිලි 02 හි කොන්ඩිපට්ටම්** අනවසර පුද්ගලයින් විසින් කඩා ඇති අතර එවා **නැවත සකස් කිරීම** සුදුසු බවත්, පෙර පාසලට යාබද ඉඩම ඝන කැලෑවක්ව පවතින අතර, පුද්ගලයින් එම ස්ථානයට ආවරණය වී අනාචාරයේ හැසිරෙන බව වාර්තා වී ඇති බැවින් **කැලෑව සුද්ද කිරීම** සුදුසු බවත්,පෙර පාසල ඉදිරිපස ඇති වැටෙහි කම්බි පහත් වි ඇති අතර **කම්බි වැට නැවත සකස් කර කණු සිටුවීම** සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී මේ සඳහා නව ඇස්මේන්තු සකස් කර පිළිසකර කිරීම සුදුසු බවත් මෙම ආයතනයටද CCTV ආරක්ෂණ පද්ධතියක් සවිකිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ සඳහා නව ඇස්මේන්තු සකස් කර පිළිසකර කිරීම සුදුසු බවත් මෙම ආයතනයටද CCTV ආරක්ෂණ පද්ධතියක් සවිකිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.08. නායකඳුර ජල යෝජනා ක්‍රමයේ ජල පරීක්ෂාවක් සිදු කිරිම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාව විසින් නාය කඳුර ජල යෝජනා ක්‍රමයේ ඉදි කල නළ ළිඳෙහි ජල ධාරිතාවය සහ ජල සාම්පල් පරීක්ෂාවක් සිදු කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් විමසීම් කරන ලදුව එවන ලද මිල ගණන් අනුව 15%ක වැට් බද්දක් ද සමඟ රු.320114.00ක මුදලක් වැය වන බව දන්වා ඇත. එබැවින් මේ සඳහා පුද්ගලික අංශයෙන් ද මිල විමසීම් සිදු කරන ලද අතර ඒ අනුව පුද්ගලික අංශයෙන් කැඳවූ මිල ගණන් අඩු මට්ටමක පවතින බැවින් GEOWATER (PVT) LTD ආයතනය වෙතින් රු 125,000.00ක මුදලක් ඉදිරිපත් කර ඇත.එසේම එම යන්ත්‍ර උපකරණ ප්‍රවාහනය අප විසින් සිදුකර ගත යුතු බවද සඳහන්වේ . පෞද්ගලික ආයතනයෙන් සිදුකර ගැනීම ලාභදායි වන බැවින් මෙම කටයුත්ත එම පුද්ගලික ආයතනය මඟින් සිදු කිරීමටත් ඒ සඳහා වැය වන මුදල සභා අරමුදලින් ගෙවීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.09. ජල බඳු නාම ලේඛනයේ නම වෙනස් කිරීම සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ජල යෝජනා ක්‍රම වල ජල බඳු නාම ලේඛනයන්හි නම් වෙනස් කිරීමේදී ලිපි ලේඛන ගාස්තුවක් ලෙස රු.3000.00ක මුදලක් අය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.10. බිබිල පුස්තකාලයේ පරිගණක අංශයේ ටයිල් ඇල්ලීම සඳහා වැය වන ඇස්තමේන්තු මුදල සම්බන්ධවයි.

බිබිල මහජන පුස්තකාලය සඳහා 2021 වර්ෂයේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එක්ව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) විසින් පුස්තකාල ස්වයංක්‍රීයකරණ කටයුතු සඳහා අවශ්‍ය රුපියල් මිලියන 5ක් වටිනා සියළු උපාංග හා උපකරණද ඒ සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම පිළිබඳව දැනුම් සම්භාරයක්ද ලබා දී ඇත. 2022 දෙසැම්බර් මස 31 දිනට පෙර මෙම පුස්තකාල ස්වයංක්‍රීයකරණ ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය අවසන් කිරීමත් සමග ජනතා අයිතියට පැවරීම හා පාඨක අවශ්‍යතා සපුරා ගැනීමට ඔවුන් වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවයක් සංවිධානය කිරීමට සිදු වී ඇති බැවින් 2023 ජනවාරි මස 27 වන දිනට පෙර පරිගණක අංශයේ බිම ටයිල් ඇතිරීම සුදුසු බවට 2023.01.05 වන දින පැවැත්වූ මහ සභා රැස්වීමේ 05.01.18 තීරණ අංකය අනුව යෝජනා සභා සම්මත වූ අතර ඒ සඳහා වැය වන ඇස්තමේන්තු මුදල රු.558,956.23 ක් වන බැවින් එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.11. බිබිල සති පොල අංක D- 24 දරණ කඩ කාමරය පවරා දීම සම්බන්ධවයි.

බිබිල, මඩකලපුව පාර ලිපිනයේ පදිංචි ඒ.ආර්.රම්මැණිකා විසින් බිබිල සති පොල අංක D- 24 දරණ කඩ කාමරය පවත්වාගෙන යනු ලබන අතර වයස්ගත වීම නිසා එම කඩකාමරය පවත්වාගෙන යාම අපහසු වීම හේතුවෙන් බිබිල, බදුල්ල පාර,36 කණුව ලිපිනයේ පදිංචි ඒ.ආර්.සේනක දමිත් කුමාර මයා වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඒ.ආර්.සේනක දමිත් කුමාර මයා විසින් බිබිල සති පොල අංක D- 24 දරණ කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.12. ආපදා ණය මුදලක් ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ කනිෂ්ඨ කාර්ය මාණ්ඩලය විසින් 2022 දෙසැම්බර් මාසයට අදාලව 2022.12.20 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම් වාර්තාවේ අංක 05.01.11 දරණ ලද සභා තීරණය මඟින් වසරකට ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයකු වෙනුවෙන් රු.100,000.00ක් බැගින් 12 දෙනෙකු සඳහාත් කණිෂ්ඨ සේවකයින් සඳහා වසරකට රු.50,000.00 බැගින් 06 දෙනෙකු සඳහාත් ලබා දීමට සභා සම්මත විය. කනිෂ්ඨ කාර්ය මණ්ඩලය විශ්‍රාම යන තෙක් බිබිල ප්‍රාදේශීය සභාවේ සේවය යෙදෙන බැවින් ජ්‍යෙෂ්ඨ කාර්ය

මණ්ඩලය හා කනිෂ්ඨ කාර්ය මණ්ඩලය ලෙස කොටස් නොකර සියළුම සේවකයින් බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය ලෙස සලකා කටයුතු කරන ලෙස ඉල්ලීම් කර ඇත. මේ පිළිබඳ සාකච්ඡා කොට තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී කණිෂ්ඨ සේවකයින් සඳහා වසරකට රු.80,000.00 බැගින් 12 දෙනෙකු සඳහාත් ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කණිෂ්ඨ සේවකයින් සඳහා වසරකට රු.80,000.00 බැගින් 12 දෙනෙකු සඳහාත් ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.13.** වාහන නවතා තැබීම වෙනුවෙන් මුදලක් අයකර ගැනීම සඳහා.

බිබිල නගරයේ නවතා ඇති කුලී වාහන (ත්‍රීවිල්,වෑන්,ට්‍රැක්ටර්,ටිපර් සහ ලොරි රථ) සඳහා පහත ආකාරයට මාසික මුදලක් අය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| වාහන | දැනට ඇති ඇතුළත් කිරීමට | වාර්ෂික ව ගෙවීම | අළුතින් ඇතුළත් කිරීම |
|---|---|---|---|
| ත්‍රිරෝද රථ | 2,000.00 | 1,200.00 | 30,000.00 |
| වෑන් රථ | 6,000.00 | 3,000.00 | 50,000.00 |
| ලොරි රථ | 3,000.00 | 2,000.00 | 40,000.00 |
| ට්‍රැක්ටර් රථ | 2,500.00 | 1,500.00 | 20,000.00 |
| ටිපර් රථ | 4,000.00 | 2,000.00 | 40,000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී රථ වාහන ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කිරීමත් ඒ සඳහා ස්ටිකරයක් ගැසීමටත් මාසිකව මෙම මිල ගණන් අය කිරිම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

රථ වාහන ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කිරීමත් ඒ සඳහා ස්ටිකරයක් ගැසීමටත් මාසිකව මෙම මිල ගණන් අය කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.14. පිඹුරු සැලසුම අනුමත කිරීම - ඩී.එම්.රත්නමාලී ජයසේකර මිය

බිබිල ,වැගම,3 කණුව,අංක 32/බී ලිපිනයෙහි පදිංචි ඩී.එම්.රත්නමාලී ජයසේකර මිය බිබිල මඩකලපුව මාර්ගයේ යශෝධරා බාලිකා විදුහල ඉදිරිපිට පිහිටා ඇති බලයලත් මිනින්දෝරු ආර්.එම්.එස්.බංඩාර මයා විසින් පිළියෙල කරන ලද අංක Mo – 4454 පිඹුර සඳහා සැලසුම් අනුමැතිය ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත. මෙම භූමිය සඳහා සැලසුම් අනුමැතිය ලබා දීමට බිබිල ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ලබා දෙන ලෙසට අවස්ථා කිහිපයකදී ලිඛිතව ඉල්ලීම් කළ අතර මේ සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අංක බි/ඉ/03/02/01/18 හා 2023.01.24 දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ මෙම භූමිය ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් දන්වා ඇති පරිදි රජය සතු ඉඩමක් බවය.එමෙන්ම මෙම ඉඩම පුද්ගලික ඉඩමක් බවට සඳහන් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවක්ද පවතින අතර 1993.10.29 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් මෙම භූමිය අවසතු කර ඇත. මෙම ගැටළුව සඳහා නීති උපදෙස් අවශ්‍යා වී ඇත. මේ පිළිබද සාකච්ඡා කොට තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී මීට සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණය, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන දැනට පවතින ගැටළු විසදා ගත් පසු ඉදිරි වැඩ කටයුතු කිරීම සුදුසු බවත් එය විසදෙන තුරු සැලසුම් අනුමත නොකර අදාල පුද්ගලයා දැනුවත් කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මීට සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණය, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන දැනට පවතින ගැටළු විසදා ගත් පසු ඉදිරි වැඩ කටයුතු කිරීම සුදුසු බවත් එය විසදෙන තුරු සැලසුම් අනුමත නොකරන බවත් එම ස්ථානයේ ඉදිකිරිම් නොකරන ලෙසට අදාල පුද්ගලයා දැනුවත් කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.15.පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමේදී ක්ෂේත්‍ර පරීක්ෂණ දීමනා ගෙවීම සම්බන්ධවයි.

2013 වර්ෂයේ සිට 2021 පෙබරවාරි මස දක්වා කාලය තුල බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි කර්මාන්ත වලට පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමේදී අයකරනු ලැබූ ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුවෙන් 30% ක මුදල ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වල නියුතු නිලධාරීන් සඳහා ගෙවීම් කර ඇත. එම ගෙවීම් නීතියානුකූල අනුමැතියකින් තොරව ගෙවා ඇති බවට විගණනය විසින් පෙන්වා දෙන ලදී. එහෙත් එම ගෙවීම් සිදු කර ඇත්තේ අලුතින් බලපත්‍ර ලබා දෙන කර්මාන්ත වලට පමණක් වුවත් අලුත් කරන ලද කර්මාන්ත සඳහා කිසිදු ගෙවීමක් සිදු කර නොමැත. එබැවින් පරීක්ෂණ කටයුතු වල නියලුනු හාහිර ආයතන වල නිලධාරින් සඳහා අදාල දිනවලට ගමන් වියදම් ගෙවන ලද්දේ නම් ඊට වඩා වැඩි මුදලක් ගෙවීමට සිදු වන බව කර්මාන්ත පරීක්ෂා කිරීමේ ලේඛනය හා වවුචර්පත් සැසඳීමේදී තහවුරු වේ.ඒ අනුව හාහිර ආයතවල නිලධාරින් හට මේ දක්වා ගෙවා ඇති මුදල් ආපසු අයකර ගැනීමට සිදු වන ලෙස ඔවුන්ට දන්වා යැවීම තුලින් ප්‍රාදේශීය සභාවේ අභිමානයට කැළලක් ඇතිවීමේ අවධානමක් පවතින බැවින් මෙම මුදල් කපා හැරීමට සුදුසු බවත්, එය පළාත් කොමසාරිස් තුමාගේ අනුමැතිය ලබා ගැනීමට සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී මෙතෙක් කල් පවත්වාගෙන ආ ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුවෙන් 30% ක මුදල ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වල නියුතු නිලධාරීන් සඳහා ගෙවීම් කිරිම සුදුසු බවටත් මෙය කොමසාරිස්තුමාගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙතෙක් කල් පවත්වාගෙන ආ ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුවෙන් 30% ක මුදල ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වල නියුතු නිලධාරීන් සඳහා ගෙවීම් කිරිම සුදුසු බවටත් මෙය කොමසාරිස්තුමාගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.16.පෞද්ගලික ආරක්ෂක නිලධාරින්ගේ සේවය ලබා ගැනිම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශිය සභාව දිනෙන් දින සංවර්ධනය වෙමින් ඉදිරියට යන රාජ්‍ය ආයතනයකි මෙහි 2013 වර්ෂයේ සකස් කල අනුමත සේවක සංඛ්‍යාවක් සේවය කරයි.මෙම ආයතනය තුල අළුතින් ස්ථාපිත කරන ලද ඒකක රාශියක් පවතින අතර එම ඒකකතුල සේවකයින් දිවා රාත්‍රී සේවයේ යෙදවිය යුතු හා ආරක්ෂා කල යුතු උපකරණ පවති. 3/2022 චක්‍රලේඛය අනුව නව සේවකයින් බඳවා ගැනීමේ හැකියාවක්ද දැනට නොමැති බැවින් ගැටළු රාශියක් පැන නැගි ඇත. මෙම ඒකක

අතර අළුතින් ආරම්භකල වාහන සේවා කිරීමේ මධ්‍යස්ථානය, පුවක්පැලේ කසල කලමනාකරන ඒකකය ආදී ස්ථානවල දිවා රාත්‍රි පැය 24 පුරාවට මුරකරුවන් යොදවා ආරක්ෂා කලයුතු උපකරණ රාශියක් පවති . ඊට තාවකාලික පිළියමක් ලෙස පෞද්ගලික ආරක්ෂක අංශයකට එම ස්ථාන භාරදී ඒ සඳහා වැය වන මුදල සභා අරමුදලින් දැරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී ආරක්ෂාව සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් කණ්ඩායමක් ඉල්ලිම සුදුසු බවත් ඒ සඳහා වැය වන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ආරක්ෂාව සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් කණ්ඩායමක් ඉල්ලිම සුදුසු බවත් ඒ සඳහා වැය වන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## <u>05.01.17.පුවක් පැලේ කසල අංගනය සඳහා අවශ්‍ය විදුලිය ලබා ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ පුවක් පැලේ කසල අංගනය සඳහා අවශ්‍ය විදුලි ලබා ගැනීමට ඉල්ලීමක් බිබිල විදුලි බල මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.විදුලි රැහැන් කිලෝමීටරයක් පමණ දුරක් ඇදීමට තිබූ බවත් ඒ සඳහා ලක්ෂ තුනහමාරක පමණ ඇස්තමේන්තුවක් විදුලි බල මණ්ඩලය විසින් එවා ඇති බවත් විදුලි රැහැන් ඇදිම පිළිබඳ සහතික කිරීමට වරලත් ගණකාධිකාරි විදුලි ඉංජිනේරුවරයකු අවශ්‍ය බව විදුලි බල මණ්ඩලය විසින් ඉල්ලා ඇති අතර එම සහතික කිරිමට වරලත් ගණකාධිකාරි විදුලි ඉංජිනේරුවරයාට රු.30,000.00ක මුදල සභා අරමුදලින් දැරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.18.ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කාර්යාලය ඉදි කිරීමට ගිවිසුම් ගත වීම සම්බන්ධවයි.</u>

2022.02.22 දින බිබිල ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීම් වාර්තාවේ අංක 05.01.21 තීරණයට අනුව ඉහත කාර්යය සඳහා අනුමත වී ඇති ඇස්තමේන්තුගත මුදල වන්නේ රු.2,900,500.00කි.නමුත් වර්තමාන මිල වැඩිවීම් මත 2023 වසර සඳහා ඇස්තමේන්තු ගත මුදල සඳහා ගිවිසුම්ගත වීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.19.රේවත මාවත හා බදුල්ල මඩකලපුව ප්‍රධාන මාර්ග යා කරමින් ප්‍රවේශ මාර්ගය සකස් කිරීම සම්බන්ධවයි.

රේවත මාවත හා බදුල්ල මඩකලපුව ප්‍රධාන මාර්ගය යා කරමින් ප්‍රවේශ මාර්ගය සකස් කිරීම සඳහා වැය වන ඇස්තමේන්තු මුදල වන රු.3,152,695.59ක මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.20. ජල ව්‍යාපෘති සඳහා උපාංග මිලදී ගැනීම සම්බන්ධවයි.

පහත සඳහන් උපාංග මිලදී ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| කර්මාන්තය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| ප්‍රාදේශීය ජල යෝජනා ක්‍රමය | 3” (80mm) ස්ලූස් වැල් (sluce valve) | 02 |
| | 3” (80mm) ෆ්ලැන්ග් ඇඩප්ටර් (Flange Adeptor) | 04 |
| රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | 3” (80mm) ස්ලූස් වැල් (sluce valve) | 01 |
| | 3” (80mm) ෆ්ලැන්ග් ඇඩප්ටර් (Flange Adeptor) | 02 |
| | 2” (50mm) ස්ලූස් වැල් (sluce valve) | 02 |
| | 2” (50mm) ෆ්ලැන්ග් ඇඩප්ටර් (Flange Adeptor) | 04 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.21. හෙළ බොජුන්හල, බිබිල ප්‍රාදේශීය සභා සේවක සුභ සාධක සංගමයට ලබා ගැනීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභා සේවක සුභ සාධක සංගමය වසර 35ක් පමණ පැරණි සංගමයකි.මේ වන විට සාමාජික මහත්ම මහත්මියින් 115ක් මෙහි සාමාජිකත්වය ලබා ඇති අතර සෑම සාමාජිකයෙක් සඳහාම වරප්‍රසාද රාශියක් ලැබේ. හෙළ බොජුන් හලේ වැඩකටයුතු අවසන් වූ පසු සුභ සාධක සංගමයට ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී සේවාව සිදු කරන එක් අයකුගෙන් දිනකට රු.200.00ක මුදලක් අය කිරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

සේවාව සිදු කරන එක් අයකුගෙන් දිනකට රු.200.00ක මුදලක් අය කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.22. බහුකාර්ය ගොඩනැගිල්ලේ අංක 06 දරණ කඩකාමරය පවරා දීම සම්බන්ධවයි.**

බිබිල, රතුපස්කැටිය,ගලහපාර ලිපිනයේ පදිංචි එච්.ආර්.දිනේෂ් රූපසිංහ මහතා විසින් බහුකාර්ය ගොඩනැගිල්ලේ අංක 06 දරණ කඩකාමරය පවත්වාගෙන යනු ලබන අතර එම කඩ කාමර ප්‍රධාන පාරට විවෘත නොමැතිකම,පිවිසුම් මාර්ගය ගේට්ටුවක් සේ පෙනීම නිසා පාරිභෝගිකයින්ගේ පැමිණීම අඩු වේ.එබැවින් කඩ කුලී ගෙවීම අපහසු වීම හේතුවෙන් බිබිල, මහියංගන පාර, රත්න සෙවන ලිපිනයේ පදිංචි ඒ.ඩී.ගඟුල් මනෝදා මයා වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඒ.ඩී.ගඟුල් මනෝදා මයා විසින් එම බහුකාර්ය ගොඩනැගිල්ලේ අංක 06 දරණ කඩකාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර රු.30,000.00ක පැවරුම් ගාස්තුවක් අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.23. උපකරණ මිල දී ගැනීම හා ප්‍රාදේශීය සභා කම්කරුවන් පුහුණු කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා කාර්මික නිලධාරි ඒ.එම්.එන්.එස්.බී.අධිකාරි විසින් ප්‍රාදේශීය සභාව හරහා කෙරෙන සුළු අලුත්වැඩියා හා නඩත්තු කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය සභා කම්කරුවන් යොදා ගැනීම නිසා ඔවුන් පුහුණු කිරීම හා පහත උපකරණ මිලදී ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

**තෝරාගත් කම්කරුවන් කීපදෙනෙකුට පුහුණු අවස්ථාවක් ලබා දීම. (කෙටිකාලීන)**

1. වැද්දුම් ශිල්ප පිළිබඳ
2. ජලනල පද්ධති  අලුත්වැඩියාව

**උපකරණ මිලදී ගැනීම**

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| කැති තල | 05 |
| චේන්සෝ යන්ත්‍ර | 01 |
| කුඩා වෙල්ඩින් ප්ලාන්ට් | 01 |
| හැන්ඩ් ඩ්‍රිල් | 01 |
| ග්‍රයින්ඩර් (කුඩා) | 01 |
| වන් ටොන් රෝලර් | 01 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.24. සීමාව ඉක්මවා වැයවූ ඉන්ධන සඳහා සහා අරමුදලින් දැරීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා වශයෙන් බල ප්‍රදේශය තුල මෙන්ම ඉන් පිටත විවිධ කාරණා සඳහා සභාපති තුමාගේ PF – 7391 අංක දරණ කැබ් රථයෙන් ගමන් කලයුතු බැවින් 2022 ඔක්තොම්බර් , නොවැම්බර්, දෙසැම්බර් මස එසේ ගමන් කල නිල ගමන් වාර වෙනුවෙන් සීමාව ඉක්මවා ඔක්තොම්බර් මස ඉන්ධන ලීටර් 89.5 ක් ද, නොවැම්බර් මස ඉන්ධන ලීටර් 174.25ක් ද, දෙසැම්බර් මස ඉන්ධන ලීටර් 254.875ක් ද ලබා ගැනීමට සිදු වූ බැවින් ඒ සඳහා වැයවූ මුදල සභා අරමුදලින් ගෙවීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| මාසය හා වර්ෂය | වැයවූ ඉන්ධන ප්‍රමාණය | අනුමත ඉන්ධන ප්‍රමාණය | වැඩිපුර වැයවූ ඉන්ධන ප්‍රමාණය | ඩීසල් ප්‍රමාණය වැඩි වීමට හේතු |
|---|---|---|---|---|
| **2023** ඔක්තොම්බර් මස | **489.5** | **400** | **89.5** | 2022.10.05 , 06, 07 යන දිනයන්හි පළාත් පාලන ලේකම් වරයා හමුවීම සඳහා කොළඹ පළාත් පාලන අමත්‍යාංශයට ගොස් නැවත කාර්‍යාලයට පැමිණීම- ගරු සභාපති තුමා |
| **2022** නොවැම්බර් මස | **574.25** | **400** | **174.25** | 2022.11.05 06 යන දෙදින තුල කොළඹ ජනාධිපති කාර්‍යාලයේ පැවති සාකච්ඡාවට හා අගමැති තුමා හමුවීමට ගොස් නැවත කාර්‍යාලයට පැමිණීම- ගරු සභාපති තුමා<br><br>2022.11.19 යන දින තුල ජනාධිපති තුමාගේ විශේෂ සාකච්ඡාවට සම්බන්ධවීම සඳහා කොළඹ පදනම් ආයතනයට ගොස් නැවත කාර්‍යාලයට පැමිණීම. ගරු සභාපති තුමා<br><br>2022.11.27 වන දින අගමැති තුමාගේ විශේෂ සාකච්ඡාවට සම්බන්ධවීම සඳහා කොළඹ අරලියගහ මන්දිරයට ගොස් නැවත කාර්‍යාලයට පැමිණීම. – ගරු සභාපති තුමා |
| **2022** දෙසැම්බර් මස | **654.875** | **400** | **254.875** | 2022.12.18, 19 යන දෙදින තුල අගමැති තුමාගේ විශේෂ සාකච්ඡාවට සම්බන්ධ වීමට කොළඹ පදනම් ආයතනය වෙත් යාම හා කොළඹ පළාත් පාලන ආයතනයේ පැවති විශේෂ සාකච්ඡාවට සම්බන්ධවී නැවත කාර්‍යාලයට පැමිණීම. – ගරු සභාපති තුමා<br><br>2022.12.22 යන දින කොළඹ නාරහෙන්පිට කම්කරු ප්‍රධාන කාර්යාලය වෙත යාම හා කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ අදාල රාජකාරි කටයුතු සඳහා ගොස් නැවත කාර්‍යාලයට පැමිණීම. – ගරු සභාපති තුමා |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.25. සීමාව ඉක්මවා වැයවූ ඉන්ධන සඳහා සහා අරමුදලින් දැරීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා වශයෙන් බල ප්‍රදේශය තුල මෙන්ම ඉන් පිටත විවිධ කාරණා සඳහා සභාපති තුමාගේ PF – 7391 අංක දරණ කැබ් රථයෙන් ගමන් කලයුතු බැවින් 2023 ජනවාරි මස එසේ ගමන් කල නිල ගමන් වාර වෙනුවෙන් සීමාව ඉක්මවා ජනවාරි මස ඉන්ධන ලීටර් 159.125 ක් ලබා ගැනීමට සිදු වූ බැවින් ඒ සඳහා වැයවූ මුදල සභා අරමුදලින් ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙසට යෝජනා කරමි.

| මාසය හා වර්ෂය | වැයවූ ඉන්ධන ප්‍රමාණය | අනුමත ඉන්ධන ප්‍රමාණය | වැඩිපුර වැයවූ ඉන්ධන ප්‍රමාණය | ඩීසල් ප්‍රමාණය වැඩි වීමට හේතු |
|---|---|---|---|---|
| **2023** ජනවාරි මස | **559.125** | **400** | **159.125** | 2023.01.02 සිට 06 වන දින දක්වා යන වන දිනයන්හි කැබ් රථයේ ධාවන කි.මී ලක්ෂ 3 ඉක්මවීමට අදාල වාර සේවාව හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා මහනුවර යුනයිටඩ් මෝටර් ලංකා ආයතනය වෙත යාම. - ගරු සභාපති තුමාගේ උපදෙස් පරිදි - රියදුරු<br><br>2023.01. 12, 13 යන දෙදින තුල පළාත් පාලන ලේකම් වරයා හමුවීම සඳහා කොළඹ පළාත් පාලන අමත්‍යාංශයට ගොස් නැවත කාර්යාලයට පැමිණීම- ගරු සභාපති තුමා<br><br>2023.01.30 යන දින අගමැති තුමාගේ විශේෂ සාකච්ඡාවට සම්බන්ධවීමට අගමැති කාර්යාලයට හා පළාත් පාලන අමාත්‍යාංශයේ විශේෂ සාකච්ඡාවට සම්බන්ධවී නැවත කාර්යාලයට පැමිණීම. ගරු සභාපති තුමා |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.26. ACTED කඩ කාමර සම්බන්ධවයි.

ACTED ආයතනය මගින් ඉදිකරන ලද කඩ කාමර 24 බදු දීම සඳහා 2021.01.19 දින මාසික සභා රැස්වීමේ දී පදික වෙළඳ සංගමය හා ACTED ආයතනය හා ප්‍රාදේශීය සභාව එක්ව තෝරා ගන්නා ලද පදික වෙළඳුන් 20 දෙනෙකු හා ACTED ආයතනය මගින් නම් කරන ලද වෙළඳුන් 04 දෙනෙකු සඳහා රු. 50000.00 කීමනි මුදලක් අය කර වසර 03 ක කාලයක් සඳහා ගිවිසුම් ගතවීම සුදුසු බව තීරණය කර ඇත.ඒ අනුව පහත සඳහන් අයට කඩ කාමර සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීමට ලිඛිතව දන්වා ඇත.

| කඩ කාමර අංකය | නම | ලිපිනය | ගෙවන ලද කීමනි මුදල |
|---|---|---|---|
| 01 | ඩබ්.එම්.ජානක ප්‍රියදර්ශන මයා | රදලියද්ද ,බිබිල | 25000.00 |
| 02 | ඩී.එම්.එරන්ද සම්පත් මයා | ළිඳකුඹුර,බිබිල | 5000.00 |
| 03 | ආර්.ඒ.පී.එන්.ලක්රුවන් මයා | දැවකැටිය,බිබිල | 5000.00 |
| 04 | කේ.එම්.ගුණවති මිය | යල්කුඹුර,බිබිල | 5000.00 |
| 05 | එච්.එම්.සිරියාවති මිය | සිරිසඟබෝ මාවත,බිබිල | 5000.00 |
| 06 | ටී.එම්.සුසිලාවති මිය | ළිඳකුඹුර,බිබිල | 5000.00 |
| 07 | එච්.එම්.සුනිල් කුමාර මයා | දොඩම්ගොල්ල,බිබිල | - |
| 08 | එච්.එම්.ජනිතා හේරත් මිය | යල්කුඹුර,බිබිල | 5000.00 |
| 09 | එස්.එම්.කරුණාවති මිය | දම්පතිගම ,බිබිල | 50000.00 |
| 10 | එච්.එම්.කරුණාවති මිය | දම්පතිගම,බිබිල | 50000.00 |
| 11 | ඩී.එම්.ලලිත් ප්‍රියදර්ශන | කිවුලපිටිලන්ද,බිබිල | 5000.00 |
| 12 | එච්.එම්.චන්ද්‍රාවති මිය | කින්දගල්ල,නාගල,බිබිල | 10000.00 |
| 13 | ඩබ්.ඒ.රංමැණිකා මිය | අඹගොල්ල හංදිය,බිබිල | 50000.00 |
| 14 | ටී.එම්.ගයාන් නිරෝෂන් මයා | යල්කුඹුර,බිබිල | 5000.00 |
| 15 | රංජිත් විජේරත්න මයා | මඩකලපුව පාර,බිබිල | 5000.00 |
| 16 | එල්.ඒ.බී.සෝමපාල මයා | කවුඩැල්ල,බිබිල | - |
| 17 | ඩී.එම්.අනුලාවති මිය | දියකොබල,බිබිල | - |
| 18 | කේ.එම්.කරුණාවති මිය | බිබිල මුල්ල,නන්නපුරාව | 5000.00 |
| 19 | ඒ.එම්.නන්දාවති මිය | හැළඹ ,නිල්ගල ,බිබිල | 50000.00 |
| 20 | ඩබ්.ඩී.නිශාන්ත කුමාර මයා | අඹගොල්ල,බිබිල | - |
| 21 | එච්.එම්.නිමල් කුමාරි | යල්කුඹුර,බිබිල | 15000.00 |
| 22 | එස්.එම්.කරුණාවති මිය | කරගහවෙල,දියකොබල,බිබිල | 50000.00 |
| 23 | දයා පත්මිණී මිය | අම්පාර,07 පාර කණුව,පිටකුඹුර,බිබිල | 5000.00 |
| 24 | ඒ.එම්.කුසුම් දයාවති මිය | දියකොළ යාය,බදුල්ල ගම්මන ,බිබිල | 5000.00 |

මෙම දැනුවත් කිරීම අනුව අංක 06,07,16,20 කඩ කාමර හැර අනෙකුත් කඩ කාමර සඳහා බදු ගිවිසුම් අත්සන් කර ඇත.එසේම මෙම කඩ කාමර සඳහා ගෙවිය යුතු කීමනි මුදල වන රු.50000.00 ක මුදල ගෙවා අවසන් නොකල වෙළඳුන්ද ඇත.එසේම මෙම කඩ කාමර සඳහා මේවන තෙක් මාසික කුලි මුදල් අය කිරීමක් ද සිදුනොවේ.

ඒ අනුව මෙම ගොඩනැඟිල්ල එලදායි කටයුත්තකට භාවිතා නොවන බැවින් LDSP ව්‍යාපෘතිය මඟින් ආහාර විජලනය ව්‍යාපෘතිය සඳහා මෙම කඩ කාමර යෙදා ගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී LDSP ව්‍යාපෘතිය මඟින් ආහාර විජලනය ව්‍යාපෘතිය සඳහා මෙම කඩ කාමර යොදා ගැනීම සුදුසු බවත් මෙම කඩකාමර සඳහා ගෙවා ඇති කී මනි මුදල ඔවුන්ට නැවත ගෙවීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

LDSP ව්‍යාපෘතිය මඟින් ආහාර විජලනය ව්‍යාපෘතිය සඳහා මෙම කඩ කාමර යොදා ගැනීම සුදුසු බවත් මෙම කඩකාමර සඳහා ගෙවා ඇති කී මනි මුදල ඔවුන්ට නැවත ගෙවීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.</u>

2023 ජනවාරි මාසයේ මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදි.

එම වාර්තාව මඟින් ඔවුන් යෝජනා කර තිබුනේ බිබිල ප්‍රාදේශීය සභාවට අයත් PF- 7391 අංක දරණ කැබ්රථය අලුත්වැඩියාව හා වාරසේවා කිරීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.321801.40 ක මුදලක් යුනයිටඩ් මෝටර්ස් ලංකා පුද්ගලික සමාගම වෙත ගෙවීමට නිර්දේශ කිරිම, බිබිල ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයේ කර්ටන් දැමීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.106287.50 ක මුදලක් ජේ.ඒ. අනුර ශාන්ත මහතා වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ගලි බවුසරයේ පොම්පය අලුත්වැඩියා කිරීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.167916.65 ක මුදලක් Solex technologies (Pvt) Ltd ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවේ කාබනික පොහොර අලෙවි මධ්‍යස්ථානය ඉදි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ගැනීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.104670.00 ක මුදලක් කැන්ඩි හාර්ඩ්වෙයාර් ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරීම හා බිබිල සතිපොල පඩිපෙළ උඩ කොටස වහලයක් ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ගැනීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.131975.00 ක මුදලක් කැන්ඩි හාර්ඩ්වෙයාර් ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරීම සුදුසු බවයි. එහි දී මන්ත්‍රී මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් කාරක සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

2022 දෙසැම්බර් මාසයට අදාල ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | **- රු. 15,925,579.02** |
| මූලධන ලැබීම් | **- රු. -** |
| **ප්‍රාග්ධන ලැබීම්** | **-** රු. - |
| වෙනත් ලැබීම් | - රු. 28,570,563.95 |
| මුළු ලැබීම් | - රු **44,496,142.97** |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු.10,512,699.59 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 4,331,468.74 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 3,685,398.90 |
| ආයෝජන | _රු. 27,000,000.00 |
| මුළු වියදම් | - රු 45,529,567.23 |

**2022.12.31 දිනට තවදුරටත් හිඟ ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 5,916,375.79 |
| අක්කර බදු | - රු. 180.96 |
| ජල ගාස්තු | - රු. 813,387.28 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 323,427.00 |
| කුලී මුදල් | - රු. 2,284,780.69 |
| ටෙන්ඩර් මඟින් කුලියටදීම් | - රු. 4,164,793.21 |
| එකතුව | - රු 13,502,944.93 |

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.
ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පලකළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## 08.වෙනත් කරුණු

## 08.01. මන්ත්‍රීවරුන් නිවාඩු බව දැන්වීම.

ගරු මන්ත්‍රී ඒ.එම්.සුදුනිලමේ මැතිතුමා වෛද්‍ය හේතුන් මත හා ගරු මන්ත්‍රිනී ඩී.එම්.කරුණාවතී මන්ත්‍රීතුමිය පෞද්ගලික හේතුවක් මත විදෙස් ගත වීම නිසා මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දැක්වීම.**

ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දක්වමින් තමා සභාවට පැමිණි මුල් කාලයේ දී ඩිජිටල් නාම පුවරුවක් සකස් කිරිමට යෝජනාවක් දැමූ නමුත් අද වන තුරු සභාවට එය කිරීමට නොහැකි වූ බවත් පෞද්ගලික ඩිජිටල් පුවරුවක් මහියංගන පාර හෙල්ත් පාර්ක් ෆාමසි එක අසල සිදු කරන බවත් ඒ සඳහා අනුමැතිය සභාවෙන් ලබා ගැනීම සුදුසු බවත් මෙවර හිටපු මන්ත්‍රීවරුන් 09 දෙනෙකු මැතිවරණයට ඉල්ලන බවත් තමාත් එක්සත් ජාතික පක්ෂයෙන් **සූර නගරයක්** යන තේමාව යටතේ මැතිවරණය දියත් කරන බවත් මැතිවරණයට ඉදිරිපත් වන මන්ත්‍රීවරුන් 09 දෙනාට නැවත සභාවට පැමිණීමට හැකි වේවා යන්න සුභ පතන බවත් බස්නැවතුම්පලේ උඩ මහලේ හා පිටුපස ආලෝක විදුලි පහන් අක්‍රියව ඇති බැවින් එහි විවිධ අනාචාරා කටයුතු සිදු වන බව කඩ හිමියන් තමාට පැවසූ බවත් ඒ ගැන අවධානය යොමු කිරීම සුදුසු බවත් බාහිර පාර්ශවයන්ගේ ඉල්ලීමක් තියෙනවා සභාවට අයිති මාර්ග අසල දිරා ගිය ගස් ඉවත් කිරිම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටද ප්‍රාදේශීය සභාවටද යන්න ජනතාව නොදන්නා බවත් එබැවින් එම වගකීම සභාව විසින් ගෙන කටයුතු කිරිම සුදුසු බවත් සතිපොල ඉදිරියෙන් පස් දමා සකස් කිරීම සුදුසු බවත් තාක්ෂණය විධිමත් ලෙස භාවිතා කරමින් බිබිල නගරය ඉදිරියට ගැනීමට කටයුතු කිරිම සුදුසු බවත් “smart city” යන සංකල්පය පෙරදැරිව කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**මූලාසනය**

ගරු මූලාසනය විසින් පිළිතුරු කථාව කරමින් ගරු මන්ත්‍රී එම්.ජී.පුන්සඳ විජය කුමාර මැතිතුමා දිගින් දිගටම නගරයේ සුභසිද්ධිය පිළිබඳ කතා කළ බවත් මන්ත්‍රී මණ්ඩලය ලෙස අපි තීන්දු තීරණ ගත්තත් විධිමත් ලෙස ක්‍රියාත්මක නොවීම ගැටළුවක් වන බවත් මෙයට හේතුව පසු විපරමක් නොමැති වීමත් යන්න ප්‍රකාශ කරන ලදී.මෙය සැබෑ පරිවර්තනයක් විය යුතු යන්න තමන්ගේ අදහස බවත් තමන්ගේ රාජකාරි මඟ හරින බවක් දක්නට ඇති බවත් ඒ හේතුව නිසා සභාවට ලොකු චෝදනාවක් එල්ලවන බවත් ඩිජිටල් නාම පුවරුව පෞද්ගලිකව ඉදි කරන බැවින් ඔවුන් සභාවට මුදලක් ගෙවීමට එකඟ වන බවත් සභාවට ආදායමක් ලැබෙන ආකාරයට එම්.ජී.පුන්සඳ විජය කුමාර මැතිතුමාට නාම පුවරුවක් සෑදීමට හැකි නම් ඒ සඳහා මිල ගණන් කැඳවා වැය වන මුදල අනුග්‍රහයකයින්ගෙන් ලබාගෙන හෝ සිදු කිරිම සුදුසු බවත් එය කාලෝචිත දෙයක් බවත් බිබිල නගරයේ බස්නැවතුම්පලේ විදුලිය සම්බන්ධව විදුලි කාර්මික වැයා දැනුවත් කළ යුතු බවත් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බවත් අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට මෙන්ම දැවමය ගැටළුවක් නම් දැව සංස්ථාවක් දැනුවත් කරන බවත් එම ආයතනය මඟින් අවධානය යොමු නොවන පුද්ගලික

ඉඩමක් නම් ඒ සඳහා වැය වන මුදල නඩු මාර්ගයෙන් ගොස් හෝ සභාවට අයකරගත හැකි බවත් මල්ලැහැව පාසල අසල ඇති දිරා ගිය ගස ඉවත් කිරීම සුදුසු බවත් සතිපොල ඉදිරිපිට මාර්ගයේ කොරෝනා කාලයේ දී ජනතාවට වෙළදාම් කිරීමට අවස්ථාව ලබා දුන් නමුත් ඔවුන් මාර්ගය දෙපස අපිරිසිදු කරන බවත් සතොස පිටුපස ඇති පස් මෙම ස්ථානයට දමා මාර්ගය සකස් කරන බවත් පිරිසිදු කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතු බවත් පසු විපරන් කිරීම සුදුසු බවත් අනිවාර්යෙන් එය කළ යුතු බවත් පැවසීය.අද 59 වන සභා රැස්වීම වන බවත් අපට ගැනිමට හැකි වූ තීන්දු තීරණ ගත් බවත් ඇතැම් යෝජනා ඉටු කිරීමට නොහැකි වූ බවත් කොම්පොස්ට් අංගනය පිළිබඳවද පසු විපරමක් තිබිය යුතු බවත් ඒ සඳහා අයෙකුපත් කළ යුතු බවත් සේ වා මධ්‍යස්ථානයේ ජැක් සවි කර ඒ සඳහා මුරකරුවෙක් පත් කිරීම කඩිනමින් මෙම කටයුතු කළ යුතු බවත් වාහන සර්විස් කිරිම සඳහා අද වන විට තරඟයක් ඇති බවත් මේ කටයුතු දියුණු කර දූරදර්ශි දැක්මකින් යුතුව ඉදිරියේ වැඩකටයුතු කළ යුතු බවත් මිනිසුන්ට ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට කටයුතු කළ යුතු බවත් ආදාහනාගාරයේ වැඩකටයුතුද අවසන් වීමට ආසන්න බවත් ජනතාව වෙනුවෙන් තමාට කළ හැකි උපරිම සේවාවන් කළ බවත් විවිධ චෝදනා මෙන්ම හිත් අමනාපකම් ඇති වුවත් තමා සත් භාවයෙන් කටයුතු කළ බවත් ජනතාවගේ සිතුවිලි වල පරිවර්තනයක් නොවන තාක්කල් මෙසේ සිදු වන බවත් පසු විපරම හා කාර්මික නිලධාරී යන පාර්ශව ආයතන තුළ ශක්තිමත් විය යුතු යන්නත් අප ගන්නා වැටුපට පෙරලා රට වෙනුවෙන් කටයුතු කළ යුතු බවත් අපට වඩා හොඳ දැක්මක් තියෙන තරුණ ජවයක් මෙතනය පත්වී ඉදිරියේදී කටයුතු කිරිමට හැකි වේවා යන්නත් හොඳ කාල වකවානුවක් මෙම ප්‍රාදේශීය සභාවට ලැබේවා යන්නත් ප්‍රාර්ථනා කරමින් සිය පිළිතුරු කථාව නිමා කරන ලදි.

මීළඟ මාසික සභාව 2023 මාර්තු මස 07 වන අඟහරුවාදා පෙරවරු 9.30ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පැවැත් වීමට තීරණය කරමින් සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

ජී.ජී.ආර්.සිල්වා,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

ජී.ජී.ආර් සිල්වා
සභාපති
බිබිල ප්‍රාදේශීය සභාව
බිබිල

පිටපත්

01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි.